මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/30/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025-12-19

**අයවැය චක්‍රලේඛ අංක: 09/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2025 අංක 23 දරන විසර්ජන පනත යටතේ 2026 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය**

**01. වියදම් දැරීම සඳහා අධිකාරී බලය**

2026 මුදල් වර්ෂය සඳහා වියදම් දැරීමට අධිකාරී බලය ලබා දෙමින්, 2025 අංක 23 දරන විසර්ජන පනත 2025.12.05 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ.

2026 වර්ෂයේ රජයේ වියදම් දැරීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීමට අදාළ වූ අධිකාරී බලපත්‍ර සඳහා මුදල් විෂයය භාර අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, 2026 වර්ෂය තුළ ගෙවීම් වවුචර්පත් හා අදාළ වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ). සාමාන්‍ය පොදු සේවා සඳහා - 2026 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ). විශේෂ නීති සේවා සඳහා - 2026 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය
(ඇ). අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2026 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය

**02. රජයේ වියදම් සම්බන්ධයෙන් වන කළමනාකරණ වගකීම**

02.1 තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් අරමුණු කරගනිමින් වසර කිහිපයකින් සියයට 7 ඉක්මවා යන වර්ධනයක් ළඟා කර ගනිමින් එහි ප්‍රතිලාභ රටේ සෑම ප්‍රදේශයකම, ප්‍රජාවන් සහ සමාජ කණ්ඩායම් අතර සාධාරණව බෙදී යන බව සහතික කිරීම ප්‍රධාන උපායමාර්ගය කරගනිමින් 2026 අයවැය සකස් කර තිබේ.

02.2 අයවැය මඟින් ඉලක්කගත කාර්යයන් සහ ප්‍රතිඵල, වර්ෂය තුළ සපුරාලීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ/ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේ ද වගකීමක් වේ. විශේෂයෙන් මූලධන සංවර්ධන ව්‍යාපෘති සහ සුබසාධන වැඩසටහන් යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. නිරන්තර පසු විපරම සහ ඉක්මන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග තුළින් වාර්ෂික ඉලක්ක සපුරා ගැනීමට වගබලා ගත යුතු වේ.

02.3 සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු වේ. එහි දී වියදම් කළමනාකරණය පිළිබඳ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් හා 2026 මූල්‍ය වර්ෂයට අදාළ 2025 අංක 23 දරන විසර්ජන පනත මඟින් දක්වා ඇති නියමයන් කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය.

## 03. 2026 වර්ෂයේ රජයේ වියදම් කළමනාකරණය

03.1 දැනට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, හා ආයතන වෙත නඩත්තු සහ පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් සලසා ඇති ප්‍රතිපාදන මඟින් ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් වැව් අමුණු, ඇළවේලි, ජලසම්පාදන යෝජනා ක්‍රම, මාර්ග, පාලම්, දුම්රිය මාර්ග, රෝහල්, බෙහෙත් ශාලා, පාසැල්, ග්‍රාමීය/ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය සේවා සලසනු ලබන ගොඩනැගිලි වැනි ජන ජීවිතය/ ජීවනෝපාය කඩිනමින් යථාතත්ත්වයට පත් කිරීම සඳහා අත්‍යාවශ්‍ය, යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ.

03.2 2025 වර්ෂයේ දී යම් වැය ශීර්ෂයක ප්‍රතිපාදන, වෙනත් වැය ශීර්ෂයක් වෙත මාරු කිරීම මගින් සිදු කරන ලද කාර්යයන්වල අවිච්ඡේද වැඩ සඳහා 2026 වර්ෂයට තවදුරටත් අවශ්‍ය වන ප්‍රතිපාදන, එම කාර්යයන් සැලසුම් කළ පරිදි නිම කිරීමට හැකිවන ලෙස, එසේ ප්‍රතිපාදන වෙන්කර දුන් වැය ශීර්ෂය මඟින් ප්‍රමුඛතා පදනමින් සලසා දිය යුතු වේ.

03.3 ආපදා බලපෑම හේතුකොටගෙන, සංවර්ධන කාර්යයන්, ඉදිකිරීම්, පුනරුත්ථාපන කාර්යයන් ආදියට අදාළව පැන නැගී ඇති කොන්ත්‍රාත් කළමනාකරණ ගැටලු විසඳීම සඳහා ආයතන ප්‍රධානියා විසින් ආයතන මට්ටමින්, සුදුසු නිපුණතාවයක් සහිත කමිටුවක් පත්කර, එම කමිටුවේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අදාළ ගෙවීම් සිදු කිරීමේ දී කොන්ත්‍රාත් ගිවිසුමේ නියමයන් හා කොන්දේසි සහ කමිටු නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

03.4 හදිසි ආපදා තත්ත්වය නිසා අඩාළ වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සඳහා 2026 වර්ෂයට අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් වෙනම සලසා දීමට කටයුතු කරනු ලැබේ.

03.5 රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් වන විධිවිධාන විස්තීරණව දක්වමින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි වියදම් පාලන උපදෙස් සහ දැනට වලංගුව පවතින අනෙකුත් චක්‍රලේඛවල විධිවිධාන තවදුරටත් වලංගු වේ.

03.6 ඇස්තමේන්තු තුළ ඇතුළත් නොවන හෝ අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ඇති කර ගනු ලබන බැඳීම් සඳහා භාණ්ඩාගාරයේ වගකීමක් නොමැති බැවින් එවැනි වියදම් සඳහා අදාළ නිලධාරීන් පෞද්ගලිකව වගකිව යුතු වේ.

03.7 යම් අත්‍යවශ්‍ය කාරණයක් සඳහා පමණක් අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටින අවස්ථාවල දී, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය සහිතව එම ඉල්ලීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වේ. අතිරේක ප්‍රතිපාදන සඳහා වන ඉල්ලීම් 2026 මුද්‍රිත විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේ දක්වා ඇති පදනම්/ හේතු කාරණාවලට පමණක් සීමා විය යුතු වේ.

03.8 වීරමොන් ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් ඉතාම අත්‍යවශ්‍ය කරුණුවල දී පමණක් සලකා බලනු ලැබේ.

03.9 පළාත් සභා සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දී මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මෙන්ම පළාත් සභා සතු ආදායම් ප්‍රභවයන් සැලකිල්ලට ගෙන අයවැය සකස් කර ඇති බැවින් ඒවායේ වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලීම් කිරීමේ දී පළාත් සභා අරමුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබිය යුතු වේ.

03.10 රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් තම විෂයපථයට අයත් කාර්යයන් වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුකර ගැනීමේ දී, එම කාර්යය ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි අදාළ මුදල් වර්ෂයේ අවසාන කාර්තුවට පෙර මුදල් රෙගුලාසි 208 යටතේ අයවැය ප්‍රතිපාදන පවරා දීම සිදුකළ යුතු වේ.

## 04. 2026 අයවැය යෝජනා සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

04.1 2026 වර්ෂයට අදාළ අයවැය මේ වන විට සම්මත වී ඇති බැවින් වැය දරන ආයතනවල මූලධන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු හා සැලසුම් දැන් සිටම ආරම්භ කළ හැකි වේ.

04.2 ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අයවැය මඟින් යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය සහ පසුවිපරම මෙන්ම සම්බන්ධීකරණය සිදුකරනු ලබන බැවින්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු එම දෙපාර්තමේන්තුව වෙත මාසිකව නියමිත ආකෘතීන් හා උපදෙස් අනුව ඉදිරිපත් කළ යුතු වේ.

04.3 මූලධන වැඩසටහන් හා අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී වාර්ෂික ඉලක්ක සම්පූර්ණ කිරීමට ඇති විය හැකි බාධාවන් වේ නම්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ආයෝජන හා ඇගයීම් කමිටුවේ සහාය ලබා දීම සඳහා නොපමාව ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු වේ.

04.4 භාණ්ඩාගාරය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා සෑම ප්‍රධාන සංවර්ධන වැඩසටහනක්ම සහ අයවැය යෝජනාවක් සඳහාම වගකිව යුතු විධායක මට්ටමේ නිලධාරියෙකු නම්කර 2026-01-15 දින වන විට ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා එවන මෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## 05. අත්තිකාරම් ගිණුම් කටයුතු

05.1 අයවැය යෝජනා මඟින් වැඩි කරන ලද උත්සව අත්තිකාරම් ගෙවීම සහ ආපදා ණය හිමිකම් සීමාව ඉහළ නැංවීම පිළිබඳව අවධානය යොමුකරමින් 2026 සඳහා වන "අත්තිකාරම් බී ගිණුම්වල" උපරිම වියදම් සීමාවන් නිර්ණය කර තිබේ.

05.2 ඒ අනුව, 2026 වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු මෙහෙයවීම විසර්ජන පනත හා අයවැය ඇස්තමේන්තුවේ දක්වා ඇති සීමාවන් තුළම කළමනාකරණය කරගත යුතු වේ. විසර්ජන පනත මඟින් නියම කර ඇති උපරිම වියදම් සීමාවන් තවදුරටත් වැඩි කිරීමට වන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. එබැවින්, පවත්නා සීමාවන් ඉක්මවා නොයන පරිදි සහ වර්ෂය තුළ ණය ලබා දීම් සිදු කිරීමට හැකි වන පරිදි, සුදුසු ප්‍රමුඛතා අනුපිළිවෙළක් ආයතන විසින් සකස් කළ යුතු වේ.

## 06. රාජ්‍ය ආයතනවල වියදම් දැරීම

06.1 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 59 (3) වගන්තිය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි අයවැය ඇස්තමේන්තුවල මූලධන වියදම් සම්බන්ධයෙන් විධිවිධාන සලසන නියෝග සාදන තෙක් දැනට ක්‍රියාත්මක වන ආකාරයටම ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් මූලධන වියදම් දැරීමට මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් මූලධන වියදම් දැරීමට පෙර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.

06.2 මූලධන වියදම් සඳහා වන අනුමැතිය වසර තුළ විටින් විට සංශෝධනය සඳහා සලකා නොබලන බැවින්, ආයතනය ස්ථාපිත අරමුණට අනුගතවන පරිදි සකස් කරන ලද මූලධන වැඩසටහන් පමණක් ඉහත එකඟතාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

06.3 රාජ්‍ය ආයතනවල වැටුප්, එදිනෙදා මෙහෙයුම් වියදම් සහ නිසි අනුමැතිය සහිතව එළැඹ ඇති බැඳීම් සඳහා වන පුනරාවර්තන වියදම් සඳහා වන මාසික අක්මුදල් අවශ්‍යතා නියමිත ආකෘතිපත්‍ර යටතේ ප්‍රධාන ගණන්දීමේ/ගණන්දීමේ නිලධාරීන්ගේ නිර්දේශ සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත සෘජුවම යොමු කළ යුතු වේ. ඒවායේ පිටපත් අදාළ වන පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වේ.

06.4 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා දෙනු ලබන ආයතන වුවත්, එම ප්‍රතිපාදන සඳහා අක්මුදල් ඉල්ලුම් කළ යුත්තේ එම ආයතනවල ඉපයීම් මෙහෙයුම් වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී පමණි. රජය සතු ආයතනවල අරමුදල් හෝ ආදායම් ව්‍යවස්ථාපිත නියමයන් මඟින් තැන්පතු ලෙස පවත්වා ගැනීම සඳහා නිශ්චිතව අවසර දී ඇත්නම් මිස, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වේ.

## 07. රාජ්‍ය ආයතනවල අරමුදල් මඟින් වියදම් දැරීම

07.1 ව්‍යවස්ථාපිත අරමුදල් මඟින් වියදම් දැරීමේ දී, ඒ පිළිබඳව නිකුත් කර ඇති අංක 01/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා අංක I/2025 (අරමුදල්) දරන 2025.04.11 දිනැති චක්‍රලේඛ ලිපිය මඟින් දක්වා ඇති නියමයන්ට යටත්ව කටයුතු කළ යුතු වේ.

07.2 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් රාජ්‍ය ආයතනවල ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යාම සීමා කර ඇති බැවින්, එම අරමුදල්වල ඉදිරි කටයුතු පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්මේන්තුව විසින් දැනටමත් ලබා දී ඇති නිර්දේශ අනුව කඩිනමින් කටයුතු කළ යුතු වේ.

07.3 ව්‍යවස්ථාපිත අරමුදල් හුදෙක් රාජ්‍ය සුරැකුම්පත් ආදීන්හි ආයෝජනය කිරීම වෙනුවට, එම අරමුදල් ස්ථාපිත කර ඇති අරමුණුවලට අනුගත වෙමින්, ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අවැසි කාර්යයන් සිදු කිරීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

**08. පැහැදිලි කරගැනීම**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කර ගැනීම්, ඇමුණුම් 01 හි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන නිළධාරියා මඟින් හෝ සෘජුවම අදාළ වන පරිදි භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මඟින් ලබා ගත හැකි ය.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව

## List of Officers in Charge of Operations in Budget Estimates of Ministry/Sector — 2026

| Ministry/Sector | In-Charge Officer Name | Designation | Phone No. | Email |
|---|---|---|---|---|
| Special Spending Units | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Buddhasasana, Religious and Cultural Affairs | Ms. Sanjeewani Weerasekara | Director | 011-2484685 (Ext -1308) | weerasekara.wmsk@nbd.treasury.gov.lk |
| Finance, Planning and Economic Development | Mr. Nirmana Mohotty | Deputy Director | 011-2484740 (Ext -1115) | mohotty.mmmn@nbd.treasury.gov.lk |
| Defence | Ms. Lakshika Senarathna | Director | 011-2034429 (Ext -4346) | senarathna.pdlp@nbd.treasury.gov.lk |
| Justice and National Integration | Ms. Jayani Priyanka | Deputy Director | 011-2151456 (Ext -2027) | priyanka.thj@nbd.treasury.gov.lk |
| Health and Mass Media | Ms. Vidarshi Abeyratne | Deputy Director | 011-2484687 (Ext -1322) | abeyarathna.kmvv@nbd.treasury.gov.lk |
| Foreign Affairs, Foreign Employment and Tourism | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Trade, Commerce, Food Security and Co-operative Development | Mr. Rasika wijekoon | Director | 011-2484690 (Ext -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| Ministry of Transport, Highways, and Urban Development | Mr. Prakrama Thennakoon | Director | 011-2484858 (Ext -1279) | thennakoon.tmdp@nbd.treasury.gov.lk |
| Agriculture, Livestock, Land and Irrigation | Ms. Nayana Thushari | Director | 011-2484760 (Ext -1326) | thusari.wan@nbd.treasury.gov.lk |
| Energy | Ms. Punya Rajapaksha | Director | 011-2484581 (Ext -1010) | rajapaksha.rap@nbd.treasury.gov.lk |
| Minister of Housing, Construction and Water Supply | Mr. Herath Banda | Director | 011-2484894 (Ext -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| Rural Development, Social Security and Community Empowerment | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| General Education | Ms. Menaka Rajaguru | Director | 011-2034445 (Ext -2084) | rajaguru.rmsm@nbd.treasury.gov.lk |
| Higher Education and Vocational Education | Ms. Muditha Gunarathna | Deputy Director | 011-2034505 (Ext -1720) | gunasekara.gdmm@nbd.treasury.gov.lk |
| Public Administration, Provincial Councils and Local Government | Ms. Rangika Sandamali | Assistant Director | 011-2432848 (Ext -1774) | sandamali.hr@nbd.treasury.gov.lk |
| Plantation and Community Infrastructure | Ms. Nayana Thushari | Director | 011-2484760 (Ext -1326) | thusari.wan@nbd.treasury.gov.lk |
| Industry and Entrepreneurship Development | Mr. Rasika wijekoon | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Fisheries Aquatic and Ocean Resources | Mr. Suranga Kasun | Deputy Director | 011-2484684 (Ext -1319) | kasun.hds@nbd.treasury.gov.lk |
| Environment | Mr. Suranga Kasun | Deputy Director | 011-2484684 (Ext -1319) | kasun.hds@nbd.treasury.gov.lk |
| Women and Child Affairs | Mr. Sudarshana De Silva | Director | 011-2484668 (Ext -1316) | silva.ksm@nbd.treasury.gov.lk |
| Minister of Ports and Civil Aviation | Mr. Herath Banda | Director | 011-2484894 (Ext -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| Digital Economy | Mr. Rasika wijekoon | Director | 011-2484690 (Ext -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| Public Security and Parliamentary Affairs | Mr. Kumara Senanayake | Director | 011-2151457 (Ext -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| Labour | Ms. Muditha Gunarathna | Deputy Director | 011-2034505 (Ext -1720) | gunasekara.gdmm@nbd.treasury.gov.lk |
| Youth Affairs and Sports | Mr. Sudarshana De Silva | Director | 011-2484668 (Ext -1316) | silva.ksm@nbd.treasury.gov.lk |
| Science and Technology | Ms. Jayani Priyanka | Deputy Director | 011-2151456 (Ext -2027) | priyanka.thj@nbd.treasury.gov.lk |
| Advance Account Activities | Mr. Kumara Senanayake | Director | 011-2151457 (Ext -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| Budget Process Management | Mr. Saman Senarathne | Director | 011-2484515 (Ext -1625) | senarathna.sc@nbd.treasury.gov.lk |